**අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා වෙත**
**විවෘත ලිපියකි.**

15.07.2009

ජනමාධ්‍යයට එරෙහිව ඇතිවී තිබෙන තර්ජන දිගින් දිගටම වැඩිවීම කෙරෙහි ජාත්‍යන්තර මාධ්‍ය නියෝජියන්ගෙන් යුත් ශ්‍රී ලංකා නිදහස් මාධ්‍ය ඒකකය සිය කනගාටුව ප්‍රකාශ කරයි. කෙසේ නමුත් කොටි සංවිධානයට එරෙහිව යුධ ජයග්‍රහණයක් ලබා තිබියදීත් රටේ මාධ්‍ය නිදහස පරිහාණියට ලක්වෙමින් තිබේ.

දෙමළ ජනමාධ්‍ය මෙතෙක් කල් මුහුණ දුන් ගැටළු සම්බන්ධයෙන් සහ එම ආයතනවල සේවය කළ පිරිසගේ ආරක්ෂාව පිළිබඳව ඔබතුමා කළ ප්‍රකාශය අප අගය කරන්නෙමු.

කෙසේවෙතත්, ශ්‍රී ලාංකීය මාධ්‍යකරුවන් හා සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍ය ආයතන තමන් සතු ප්‍රජාතාන්ත්‍රික අයිතීන් අනුව සිය නිදහස හා ආරක්ෂාව වෙනුවෙන් ගත යුතු පියවර බොහෝමයක් ඇති බව අපගේ විශ්වාසයයි.

ලංකාවේ පුවත්පත් නිදහස මුහුණ දෙන ගැටළු නිරාකරණය කිරීම සඳහා මාධ්‍ය නිදහස වෙනුවෙන් වූ ජාත්‍යන්තර නියෝජිතයන් විසින් කරුණු 11 කින් යුත් යෝජනාවක් ඔබතුමා සහ ඔබතුමාගේ රජය වෙත මෙසේ ඉදිරිපත් කිරීමට කැමැත්තෙමු.

1. මාධ්‍යවේදී ඝාතන සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණ කිරීම සඳහා විශේෂ නඩු පැවරීමේ ඒකකයක් ස්ථාපිත කළ යුතුය. 2007 සිට මේ වනතුරු ඝාතනය වූ මාධ්‍යවේදීන් සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් මෙතෙක් නිමවී නැත.

2. මාධ්‍ය නිදහස හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ජාත්‍යන්තර පිළිවෙතට අනුව සෑම මාධ්‍යවේදියකුටම හිමිවිය යුතුය. විශේෂයෙන් ප්‍රාදේශීය සභා ඡන්දය පැවැත්වීමට නියමිතව තිබෙන යාපනය හා වවුනියා යන දිස්ත්‍රික්කයන්හි මේ තත්වය වහා ඇති කළ යුතුය.

3. 2008 මාර්තු මස සිට හදිසි නීතියට පසුවත් 2006 ත්‍රස්ත මර්දන නීතිය යටතේ රඳවා සිටින ජේ එස්. තිස්සනායගම්, වී. ජසිහරන් සහ වී. වලර්මදි යන අය වහා නිදහස් කළ යුතුයි. මාධ්‍යකරුවන්ට හා අදහස් ප්‍රකාශ කිරීමට එරෙහි ගන්නා ලද සියලු අසාධාරණ පැමිණිලි ඉවත් කළ යුතුයි. නීතියට අනුව ක්‍රියාකරන මාධ්‍යවේදීන්ට දඬුවම් කිරීම සඳහා භාවිතාවේ පවතින සියලු නීති රීති අවලංගු කළ යුතුය.

4. 2009 දි ඝාතනයට ලක්වූ මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග මහතාගේ ඝාතනය පිළිබඳව වන පරීක්ෂණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ යුතුය.

5. නිදහස් හා සාධාරණ ලෙස තොරතුරු ප්‍රකාශ කිරීම සඳහා අවතැන් වූවන්ගේ කඳවුරුවලට යෑමට කොන්දේසි රහිත අවසරයක් ලබා දිය යුතුය. සාමය උදා කිරීමට හා නව සමාජ ඒකාග්‍රතාවයක් සඳහා මාධ්‍යයට මහගු සේවයක් ඉටු කළ හැකිය.

6. මාධ්‍යවේදීන්ට හා පුවත්පත් කතුවරුන්ට එරෙහිව චෝදනා කර ඔවුන් දිගු කලක් සිරභාරයේ තැබිය හැකි බලයෙන් යුතු 1973 වසරේ අංක 5 දරණ පුවත්පත් මණ්ඩල නීතිය අවලංගු කොට පෙර තිබු පරිදි මාධ්‍ය නිදහස තර කළ යුතුය.

7. ප්‍රජාතාන්ත්‍රික සමාජයක අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිවාසිකම් පිළිබඳ ආරක්‍ෂක අංශ දැනුවත් කළ යුතුයි. 2007 සිට ආරක්‍ෂක නිලධාරීන් විසින් අවම වශයෙන් මාධ්‍යවේදීන් 30 දෙනෙකු පමණ තර්ජනයට ලක්ව තිබෙන බව වාර්තා වී තිබේ.

8. ආරක්‍ෂක නිලධාරීන් විසින් නීතියෙන් තොරව රැඳවුම් භාරයට ගැනීම හා පහරදීම්වලට ලක්වූ මාධ්‍යවේදීන් හට වන්දි මුදල් ලබාදෙන ලෙස තීන්දු කළ යුතුය.

9. 2006 මානව හිමිකම් කවුන්සිලෙහි ශ්‍රී ලංකා රජය පොරන්දු වූ ආකාරයට අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස වෙනුවෙන් වූ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයාට ලංකාවට පැමිණීම සඳහා ඇරයුම් කළ යුතුය.

10. නිදහස් මාධ්‍යකරුවන්ට එරෙහිව කරන ලද ප්‍රකාශ හා තර්ජන නතර කිරීමට රාජ්‍ය මාධ්‍ය ආයතන වහා ක්‍රියා කළ යුතුය. මෙම මාධ්‍ය ආයතන විසින් කොටි හිතවාදීන් ලෙස සමහර මාධ්‍ය ආයතනයන්ට එල්ල කළ බොරු චෝදනා ප්‍රචාර හේතුවෙන් බොහෝ මාධ්‍යවේදින්ගේ ජීවිත නිකරුණේ අවදානමට ලක්වී තිබේ.

11. මහජනයාගේ යහපත වෙනුවෙන් වූ අයිතිවාසිකම්, නීතිය හා සංදේශ නීති මාලාවන් සංශෝධනය කිරීම තුළින් පවතින රාජ්‍ය මාධ්‍ය ආයතන නිදහස් පොදු මාධ්‍ය ආයතන බවට පරිවර්තනය කිරීම සඳහා විධිමත් නීතියක් හඳුන්වා දිය යුතුය.

ඔබතුමා රටේ සංවර්ධනය උදෙසා ගෙන යන වැඩ කටයුතු අප අගය කරන්නෙමු. ඒ අතර අනාගතයේදී ප්‍රජාතාන්ත්‍රික සමාජයක් උදාකිරීම සඳහා ඔබතුමා පියවර ගනිතැයි අපි විශ්වාස කරන්නෙමු. ඒ ප්‍රජාතාන්ත්‍රික ශ්‍රී ලංකාව බිහිකිරීම සඳහා මාධ්‍ය නිදහස වැදගත් වේ.

ඔබතුමා මෙම කරුණු කාරණා සැලකිල්ලට ගෙන මාධ්‍යයවේදීන් බියෙන් තොරව තම රාජකාරිය කිරීමට සුදුසු පරිසරයක් උදා කිරීම සඳහා පියවර ගනු ඇතැයි ජාත්‍යන්තර මාධ්‍ය ආයතන වන අප විශ්වාස කරන්නෙමු.

2006 ඔක්තෝබර්, 2007 ජුනි, 2008 ඔක්තෝබර් වැනි කාලය තුළ ජාත්‍යන්තර මාධ්‍ය ආයතන ලංකාවේ සංචාරය කර තිබේ. එය ජාත්‍යන්තර මාධ්‍ය නිදහස හා මාධ්‍යය සංවර්ධනය වෙනුවෙන් වූ සංවිධාන 12 කින් සමන්විතය.

ARTICLE 19
Committee to Protect Journalists (CPJ)
International Federation of Journalists (IFJ)
International Media Support (IMS)
International News Safety Institute (INSI)
International Press Institute (IPI)
Reporters Without Borders (RSF)
World Association of Newspapers and News Publishers (WAN-IFRA)
World Press Freedom Committee (WPFC)